# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2258/53 – 2021 දෙසැම්බර් මස 17 වැනි සිකුරාදා – 2021.12.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/05/2017/45.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

සමස්ත ලංකා මෝටර් සේවක සමිතිය, 10/21ඒ, ජයසුන්දර පෙදෙස, ඇල්හේන පාර, මහරගම.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, පන්නිපිටිය, කඳවල පාර, අංක 55, නීතීඥ බිනර ඒ. ගුණසේකර මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

නිමල් සිරිපාල ද සිල්වා,
කම්කරු අමාත්‍ය.

2021 දෙසැම්බර් මස 09 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/05/2017/45.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

සමස්ත ලංකා මෝටර් සේවක සමිතිය, 10/21ඒ, ජයසුන්දර පෙදෙස, ඇල්හේන පාර, මහරගම.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ අවිස්සාවේල්ල ඩිපෝවේ ආරක්ෂක පරීක්ෂකවරයකු ලෙස සේවය කළ ජී. පී. ගුණතිස්ස මහතාට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් 2017 මැයි මස 05 වැනි දින ලබාදුන් විනය නියෝගය මගින් අසාධාරණයක් සිදුව තිබේ ද? යන්නත්, අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට කුමන සහනයන් හිමිවිය යුතු ද යන්නත් පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2021 දෙසැම්බර් මස 02 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 12 – 0188

---

මගේ අංකය: IR/13/28/2013.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

එච්. කේ. එන්. එස්. හේරත් මයා, සරාගී, වැල්ලෙතොට, පාලටුව.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කොළඹ 04, ගාලු පාර, බම්බලපිටිය, අංක 411/16, නීතිඥ ආර්. නවෝදයම් මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2021 නොවැම්බර් මස 30 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/13/28/2013.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එච්. කේ. එන්. එස්. හේරත් මයා, සරාගී, වැල්ලෙතොට, පාලටුව.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ හක්මන ඩිපෝවේ සහකාර කළමනාකාර ඉංජිනේරුවරයකු වශයෙන් සේවයේ නිරතව සිටි එච්. කේ. එන්. එස්. හේරත් මහතාට 2011.08.27 වන දින සිට වේතන රහිතව සේවය තහනම් කර විනය පරීක්ෂණයෙන් අනතුරුව ලබාදුන් දඬුවම් තුළින් අසාධාරණයක් සිදු වූයේ ද? යන්න හා එසේ අසාධාරණයක් සිදු වූයේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේද? යන්න පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2021 නොවැම්බර් මස 29 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 12 – 0189